මාධ්‍ය නිවේදනය

2018 පෙබරවාරි 01, කොළඹදී...

# නෙස්ලේ සමාගම තම ‘Nestlé Needs Youth’ වැඩසටහන අනුව යමින් කැලණිය විශ්ව විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තබයි

*නෙස්ලේ වෘත්තිකයින් විසින් මෙහෙයවන ඩිප්ලෝමා පාඨමාලා හරහා රටෙහි තරුණ රැකියා නියුක්තියට සහාය වේ.*

නෙස්ලේ සමාගම පසුගියදා කැලණිය විශ්ව විද්‍යාලයේ අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය සමඟ විශේෂ ගිවිසුමකට අත්සන් තැබීය. එනම් එහි දක්ෂතම අලෙවි කළමනාකරණ සිසුන්ගේ උපාධියට වැඩි වෘත්තීය සුදුසුකමක් එක් කරනා ‘වරලත් වෘත්තීය අලෙවිකරණ උපාධිධාරී’ (Certified Professional Marketing Graduate - CPMG) වැඩසටහන සඳහා උපක්‍රමික හවුල්කරු (strategic partner) ලෙස නෙස්ලේ සමාගම සම්බන්ධ වෙමිනි. මෙරට තරුණ රැකියා නියුක්තිය වර්ධනය කිරීමේ අදහසින් ඔවුන්ගේ කුසලතා සහ පුහුණුව දියුණු කිරීම සඳහා නෙස්ලේ සමාගම දියත් කර ඇති ‘Nestlé Needs Youth’ නම් නව වැඩපිළිවෙලේ අංගයක් ලෙස මෙම ගිවිසුමට එළඹුණි.

CPMG වැඩසටහනේ කොටසක් ලෙස විශ්ව විද්‍යාල සිසුන් 30 දෙනෙකුට නෙස්ලේ වෘත්තිකයින් විසින් සහයෝගීතාව, නායකත්වය, නවෝත්පාදන හා පෞද්ගලික සංවර්ධනය යනාදී වශයෙන් මානව කුසලතා පිළිබඳ ඩිප්ලෝමාව (Diploma in People Skills) යටතට ගැනෙන විෂයන් 15 ක් ඉගැන්විණ. නෙස්ලේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි පුහුණු මධ්‍යස්ථානයේදී මෙම අධ්‍යයන වාර පැවැත්වුණි. එහිදී නෙස්ලේහි වෘත්තිකයින් විසින් විවිධ පුහුණු භාවිතාවන් ඔස්සේ න්‍යායාත්මක හා ප්‍රායෝගික යෙදවුම් පිළිබඳ එම සිසුන් දැනුවත් කෙරුණි. තව ද වෙළෙඳපොළ පිළිබඳ පූර්ණ විශ්ලේෂණයක් හා සැබෑ අත්දැකීමක් ලබාගනු වස් ප්‍රදේශ තුනක ක්ෂේත්‍ර චාරිකාවලද සිසුහු නිරත වූහ. මානව කුසලතා පිළිබඳ ඩිප්ලෝමාවේ පළමු කණ්ඩායම පසුගියදා සාර්ථකව එය නිමාවට පත් කළ අතර නෙස්ලේ සහ කැලණිය විශ්ව විද්‍යාලය යන ආයතන දෙකෙන්ම ඔවුන්ට සහතික හිමිවිය. එහිදී දක්ෂතම සිසුන් 10 දෙනාට හය මසක කාලයක් තුළ නෙස්ලේ සමාගමේ අලෙවි පුහුණුවක් ලබාදෙනු ඇත.

මේ පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ මානව සම්පත් අංශයේ උප සභාපතිනී ඉනෝකා සිරිමාන මහත්මිය මෙසේ පැවසුවාය. “ගෞරවාන්විත ආයතනික පුරවැසියෙකු වශයෙන් අනාගත නායකයින් ශක්තිමත් කිරීමත් ධනාත්මක වෙනසක් ඇතිකිරීමත් අප සතු යුතුකමක්. ලොව පුරා ‘Nestlé Needs Youth’ වැඩසටහන ආරම්භ කළේත් තරුණ පරම්පරාවට අධ්‍යාපනයේ සිට රැකියාව දක්වා පරිවර්තනය වීම සඳහා සහාය දැක්වීමටයි. මෙම ගෝලීය වැඩසටහන හා ඒකාත්මික වෙමින් අපේ රටේ දක්ෂ තරුණ තරුණියන්ට රැකියා ස්ථානයට හැඩගැසීමට සහාය වෙමින් සේවාස්ථ පුහුණු (internships) අවස්ථා සහ පුහුණු

(traineeships) අවස්ථා ලබාදීමට අපි පියවර ගෙන තිබෙනවා. එහිදී විශ්ව විද්‍යාල සිසුන්ගේ රැකියාපොළ වැඩසටහන් හා කුසලතා සංවර්ධන වැඩසටහන් ආදියෙන් දේශීය විශ්ව විද්‍යාල පද්ධතිය සමඟ අපේ ඇති බැඳීම් ශක්තිමත් වී පවතිනවා. අද දින වෙනස් වන වැඩ ගතිකය සමගින් 'ඉගෙනීමේ හැසිරීම', මූලික අවශ්‍යතාවයක් ලෙස වැඩි ඉල්ලුමකින් පවතී. ප්‍රමුඛ පෙළේ දක්ෂ උපාධිධාරීන් බිහිකරන ආයතනයක් ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටින කැලණිය විශ්ව විද්‍යාලය සමඟ අපගේ ආසන්නතම සහයෝගීතාවය ඔස්සේ සිසුන්ගේ එම දක්ෂතාව සවිබල ගැන්වීමටත්, ඔවුන්ට සාර්ථකව රැකියා වෙළෙඳපොළට පිවිසීම සඳහා සහාය වීමක් ලෙස සමාගම් ලෝකය පිළිබඳ අත්දැකීමක් හිමිකරදීමත් සිදුවෙනවා."

නෙස්ලේ ආයතනය තුළ පවා තරුණ වයසේ පසුවන්නන්ට වැඩි රැකියා අවස්ථා ඉඩකඩක් නිර්මාණය කරදී තිබේ. එනම් අද නෙස්ලේ සේවා නියුක්තිකයන්ගෙන් 35% ක් වයස අවුරුදු 30 ට අඩු අය වන අතර ආයතනයේ මුළු සේවක සංඛ්‍යාවෙන් 60%ක් 1980ට පසුව ඉපදුණු නව සහස්‍රකයේ පුද්ගලයන් වේ. එමෙන්ම ජීව දත්ත පත්‍රිකා (CV) සකස්කිරීම හා (Interviews) රැකියා සම්මුඛ පරීක්ෂණවලට පුරුදු වීම යනාදිය සම්බන්ධයෙන් ඩිජිටල් මාධ්‍ය මෙන්ම රැකියාපොළ සහ වැඩමුළු වැනි වැඩසටහන් ඔස්සේ ද තරුණ පරපුරට රැකියා අවස්ථා වෙනුවෙන් සූදානම් කරලීමට ද නෙස්ලේ සමාගම පියවර ගෙන ඇත.

මේ පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ කළමනාකාර අධ්‍යක්ෂිකා ෂිවානි හෙග්ඩේ මහත්මිය මෙසේ පැවසුවාය. "ඵලදායී ප්‍රවර්ධනයන් සතු ප්‍රජාවක් සංවර්ධනය කිරීම, සමාගමක් ලෙස අපේ අරමුණේ එක් අංශයක්. ඒ අනුව සියලු දෙනාට සමාන අවස්ථා පිරිනමමින් යහපත් රැකියා අවස්ථා සහ විවිධත්වය ප්‍රවර්ධනය කිරීමට නෙස්ලේ සමාගම කැපවී සිටිනවා. තරුණ ප්‍රජාව අපේ සමාජයේත් ආර්ථිකයේත් අනාගතයයි. සාම්ප්‍රදායික අධ්‍යාපනය බොහෝ විට ප්‍රමාණවත් නොවේ. වේගයෙන් වෙනස්වෙන, ඩිජිටල් රැකියා පරිසරයක් වෙත හැඩගැසීමට නම් නිසි කුසලතා අවශ්‍ය වෙනවා. සංවර්ධනයේ මීළඟ පිම්ම ලෙස හැඳින්විය හැකි තරුණ ප්‍රජාවගේ කුසලතාවන් ප්‍රයෝජනයට ගත නොහැකි නම් සමාගමක් ලෙස සාර්ථක වීමටත් ප්‍රජාවන් වර්ධනය කිරීමට උපකාර කිරීමටත් අපහසු වේ. මේ දිගුකාලීන ප්‍රවේශය සැමවිටම නෙස්ලේහි ජාන හා බද්ධවූවක්."